## ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

### 1. මූල්‍ය ප්‍රකාශන

#### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන වලින් 2011 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

#### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

##### 1.2.1 නොසැසඳූ පාලන ගිණුම්

ලංකා බැංකුවේ සමූහ ශාඛාවේ ජංගම ගිණුමේ මුදල් පොතට අනුව ශේෂය හා ගලපන ලද බැංකු ගිණුම අතර රු. 4,338 ක වෙනසක් නිරූපණය විය.

##### 1.2.2 ගෙවිය යුතු ගිණුම්

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ජංගම බැරකම් යටතේ ගෙවිය යුතු කුවේට් වන්දි අරමුදල් ලෙස දක්වා තිබූ රු.2,303,706,838ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබූ අතර, ඉන් රු.2,260,225,494ක් දිගුකාලීන හා කෙටිකාලීන ආයෝජනයන්හි යොදවා තිබුණි.

(ආ) පහත පෙන්වා ඇති විගමණික ශ්‍රමිකයින්ට අයත් 2011 දෙසැම්බර් 31 දිනට එකතුව රු. 36,324,036 ක මුදල් වෙනම බැංකු ගිණුමක ආයෝජනය කිරීම හෝ නිරවුල් කිරීමට කටයුතු නොකර කාර්යාංශ පොදු රුස්කිරීම් ගිණුමෙහ පවත්වාගෙන ගොස් තිබුණි.

| විස්තරය | මුදල |
|---|---|
| | රු. |
| විගමණිකයන්ගේ පැමිණිලි සමතයකට පත් කිරීම සඳහා ලැබූ මුදල | 14,530,607 |
| කොරියානු රැකියා සඳහා පිටත්ව ගිය විගමණිකයන්ගේ ඇප තැන්පතු | 17,399,465 |
| රක්ෂණ වන්දි ලෙස ජාතික රක්ෂණ සංස්ථාවෙන් ලද මුදල | 4,393,964 |
| | 6,324,036 |

### 1.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂය තුළදී චෙන්නායිහි වෛද්‍ය මධ්‍යස්ථානයක් පිහිටුවීම සඳහා ඇමරිකානු ඩොලර් 4,650කට සමාන මුදලක් හා රු.134,890ක් වැයකර විදේශ චාරිකාවක් සිදු කර තිබුණද එහි ශක්‍යතා වාර්තාවක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ආ) 2007 වර්ෂයේ සිට විදේශ සේවා නියුක්ති නියෝජිතායතනයේ බැංකු ජංගම ගිණුම් 02 ක පැවති රු. 5,763 ක හා රු. 1,444 ක අයිරා ශේෂ සනාථ කර ගැනීම සඳහා සාක්ෂි ඉදිරිපත් නොවීය.

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කාර්යාංශයේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය ආදායම් බදුවලට පෙර රු.මිලියන 606.4 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.මිලියන 591.08 ක් විය. මේ අනුව අතිරික්තයෙහි රු.මිලියන 15.32 ක එනම් 2.6 % ක වැඩිවීමක් පෙන්නුම් කෙරිණි. ඉකුත් වර්ෂය හා සැසඳීමේදී මුළු ආදායම රුපියල් මිලියන 152 කින් වැඩිවීම එයට බලපා තිබුණි.

(2010 වර්ෂය සඳහා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර නොතිබුණු බැවින් සංසන්දනාත්මක මූල්‍ය ප්‍රතිඵල, කාර්යාංශයේ මෙහෙයුම් කටයුතුවලට අදාලව පමණක් දක්වා ඇත.)

### 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

කාර්යාංශයේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ඇගයීමේදී කාර්යාංශය මෙහෙයුම් අලාභ ලබන තත්ත්වයක් අනාවරණය වූ අතර, එම මෙහෙයුම් අලාභය ආයෝජන පොළිය මගින් ආවරණය කරගෙන තිබුණි.
2009 වර්ෂයේ සිට 2011 වර්ෂය දක්වා වූ මූල්‍ය ප්‍රතිඵල පහත පරිදි වේ.

| | 2011 | 2010 | 2009 |
|---|---|---|---|
| | රු.රු.000 | රු.රු.000 | රු.රු.000 |
| මෙහෙයුම් ආදායම | 1,209,369 | 1,164,160 | 1,011,094 |
| මුළු වියදම | 1,655,585 | 1,518,276 | 1,362,321 |
| මෙහෙයුම් අලාභය | (446,216) | (354,116) | (351,227) |

| | | | |
|---|---|---|---|
| ආයෝජන පොලිය | 618,938 | 520,461 | 486,085 |

මේ අනුව 2009 වර්ෂයට සාපේක්ෂව 2010 හා 2011 වර්ෂවල මෙහෙයුම් ආදායම 15% ක් හා 20%ක් ලෙසද, මුළු වියදම 11% ක් හා 22% ක් ලෙසද වැඩි වී තිබුණු අතර, මෙහෙයුම් අලාභයේද 0.8 % ක හා 27% ක වැඩිවීමක් පෙන්නුම් කෙරිණි. තවද ආයෝජන පොළියේ 7% ක හා 27 % ක වර්ධනයක්ද පෙන්නුම් කෙරිණි.

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) කොරියානු රැකියා සඳහා පිටත්ව යන එක් පුද්ගලයකුගෙන් රු.49,500 ක පමණ මුදලක් සුභ සාධන කටයුතු සඳහා අයකර තිබුණු අතර, සමාලෝචිත වර්ෂය තුළදී අයකළ මුදල රු. 201,223,729 ක් විය. මෙලෙස සුභ සාධනය වෙනුවෙන් මුදල් අයකළද, කිසිදු සුභ සාධන වැඩපිළිවෙලක් හඳුන්වා දී නොතිබුණ අතර, මෙම මුදල් වෙනම බැංකු ගිණුමක ආයෝජනය කිරීමට කටයුතු නොකර පොදු බැංකු ගිණුම යටතේ රඳවා තබාගෙන තිබුණි. සුභ සාධන කටයුතු සඳහා 2010 වසරේ රු. 45,076,170 ක මුදලක් කොරියාවේ ආයතනයකට ගෙවා තිබුණු අතර, එම ආයතනය විසින් කිසිදු සුභසාධන කටයුත්තක් 2012 ජුනි වන විටත් සිදුකර නොතිබුණි.

(ආ) කොරියානු පුහුණුව සඳහා එක් පුද්ගලයකුගෙන් රු.15,000 ක මුදලක් කාර්යාංශය විසින් අය කරනු ලබන අතර, එම පුහුණු කාර්යය ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති නියෝජිත (පෞද්ගලික) සමාගමට භාර දී තිබුණු අතර, ඒ සඳහා එම පෞද්ගලික සමාගමට සමාලෝචිත වර්ෂය තුළදී රු.69,257,429ක් ගෙවා තිබුණි. කාර්යාංශය සතුව දැනට පුහුණු මධ්‍යස්ථාන 25 ක් හා පුහුණුව භාර නිලධාරීන් 200 කට ආසන්න සංඛ්‍යාවක් සේවයේ යෙදී සිටියදී, පුහුණුවට අවශ්‍ය පහසුකම් කාර්යාංශය විසින් සළසා නොගෙන කොරියන් විගමණිකයන්ගේ පුහුණු කටයුතු වෙනත් ආයතනයක් වෙත පැවරීම නිසා ඒ තුළින් කාර්යාංශයට ලැබිය හැකිව තිබූ ආදායම අහිමි වී තිබුණි.

(ඇ) කොරියානු විගමණිකයන් වෙත ආපසු ගෙවීම සඳහා එක් අයෙකු වෙනුවෙන් රු.50,000 බැගින් 2006 හා 2007 වර්ෂවල දී විදේශ සේවා නියෝජිත ආයතනයේ තැන්පත්කර ඇති අතර, 2009 වර්ෂයේ සිට ආපසු පැමිණෙන විගමණිකයින්ට එම මුදල් ගෙවිය යුතු වුවත්, ඔවුන්ට රු.25,000 ක් පමණක් ගෙවා තිබුණි. 2011 දෙසැම්බර් 31 දිනට ආපසු නොගෙවා ඇති මුදල රු.28,740,000 ක් විය. මෙම මුදල් ගෙවීම සම්බන්ධව විගමණිකයින් පැමිණිලි කර ඇතත් මෙතෙක් ගෙවීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) කාර්යාංශය විසින් ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ ශේෂ පත්‍රයට අනුව පහත සඳහන් පරිදි විවිධ ආයතන වෙත රු.18,672,448 ක් තැන්පත් කර තිබුණු අතර, ඒවා අයකර ගැනීම සම්බන්ධව කිසිදු පසුවිපරමක් කර නොතිබුණි.

| විස්තරය | 2011 |
|---|---|
| | රු. |
| විවිධ තැන්පතු | 17,599,463 |
| වෙනත් ලැබිය යුතු දෑ | 29,375 |
| ලැබිය යුතු කොරියානු වන්දි | 156,000 |
| ඉතාලියේ ඇති ශ්‍රී ලංකා තානාපති කාර්යාලය | 887,610 |
| | 18,672,448 |

(ඉ) 2009 වර්ෂයේ සිට බැංකු ගිණුම් 02 ක් යටතේ වූ හඳුනා නොගත් හර ශේෂයන්හි එකතුව රු.812,260 ක් සහ 2004 වර්ෂයේ සිට පැවත එන තැන්පත් කල නමුත් උපලබ්ධි නොවූ ශේෂය රු.750 ක් නිරවුල් කිරීමට 2013 ජනවාරි 09 දින දක්වා කටයුතු කර නොතිබුණි.

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

මු.රෙ. 371 ප්‍රකාර මාණ්ඩලික නිලධාරියකුට එකවර රු.20,000 උපරිමයකට යටත්ව තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කළ හැකි වුවද, එම සීමාව ඉක්මවා එකවර රු.100,000 කට වැඩියෙන් නිලධාරීන් 95 කට තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි. රුපියල් මිලියනයකට වඩා වැඩි තත්කාර්ය අතුරු අග්‍රිම දෙකක් ලබාදී තිබූ අතර, ඉන් 50% කට වඩා ඉතිරිවීමද අනාවරණය වීම නිසා නිවැරද ඇස්තමේන්තු කිරීමකින් තොරව අග්‍රිම නිකුත් කළ බව නිරීක්ෂණය විය.

### 3.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) වොලිබෝල් ක්‍රීඩාව වෙනුවෙන් කාර්යාංශය රු.6,119,304ක් වියදම් කර තිබුණු අතර, මෙයින් රු.1,500,000ක් වෙරළ ක්‍රීඩා උත්සවයක් වෙනුවෙන්ද රු.1,159,304ක් චීනයේ පැවැත්වූ 16 වැනි ආසියානු කාන්තා වොලිබෝල් තරඟය සඳහා ක්‍රීඩිකාවන් හය දෙනෙක් සහ නිලධාරීන් දෙදෙනෙක් විදේශ ගතවීම් වෙනුවෙන් ද දරන ලද වියදම් විය.

(ආ) සමාලෝචිත වර්ෂය තුලදී විදේශ චාරිකා සඳහා රු. 5,631,853ක මුදලක් සහ කුලී රථ වියදම් වෙනුවෙන් රු.4,691,112ක මුදලක් අමාත්‍යාංශය වෙනුවෙන් කාර්යාංශය විසින් ගෙවා තිබුණි.

3.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

2001 ජුනි 01 දින සහන පියස මධ්‍යස්ථානය ආරම්භ කරන අවස්ථාවේ සිට පැවති අධිශීතකරණය සමාලෝචිත වර්ෂය දක්වා වසර දහයක් තිස්සේ අදාල කාර්ය සඳහා භාවිතා කිරීමකින් තොරව නිෂ්ක්‍රීයව පැවතුණි.

3.5 ආර්ථික නොවූ ගනුදෙනු

1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනතේ 52 (1) උප වගන්තිය අනුව ශ්‍රී ලංකාවෙන් පිටත සේවා නියුක්තිය සඳහා යම් තැනැත්තෙකු බඳවා ගැනීම සම්බන්ධයෙන් බලපත්‍ර ලාභියෙකු විසින් ලබා ගත් සෑම කොමිස් මුදලකින්ම 5% ක අනුප්‍රමාණයෙන් ගණන් බලනු ලැබූ සෙස් බද්දක් ගෙවිය යුතු විය. තවද, 2009 අංක 56 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ (සංශෝධිත) පනතේ 7 (5) වගන්තිය ප්‍රකාරව එම මුදල සාධාරණ නොවන සහ ලැබිය යුතු මුදලට වඩා අඩු මුදලක් වන අවස්ථාවක කොමිස් මුදල විය යුත්තේ අමාත්‍යවරයා විසින් නියම කරන ලද මුදල වන්නේය. මීට අමතරව එම පනතේ 7(6)(3) උප වගන්තිය යටතේ සෙස් බද්ද ගෙවීම බලපත්‍ර ලාභියෙකු විසින් පැහැර හරින අවස්ථාවක බලපත්‍ර ලාභියා වරදකට වරදකරු වන අතර, රු. 5,000 කට නොඅඩු දඩයකට ඔහු යටත් විය යුතුය. උක්ත වගන්තිවලින් එසේ බලතල ලබාදී තිබියදීත් බලපත්‍රලාභීන්ගෙන් ඔවුන් උපයා තිබූ කොමිස් මුදල් අනුව සෙස් බදු අයකර ගැනීමට කාර්යාංශය කටයුතු නොකර විගමණිකයන් වෙනුවෙන රු.500 හා රු.250 බැගින් විවිධ රේටයන් යටතේ සෙස් බදු ගණන් බලා අයකර තිබුණි.

3.6 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් කාර්යාංශයේ සම්පත්

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 ඡේදයට පටහැනිව කාර්යාංශය සතු සම්පත් වෙනත් රාජ්‍ය ආයතන හා පුද්ගලයින් වෙත ලබා දී තිබුණි. විස්තර පහත දැක්වේ.

(අ) රාජ්‍ය ව්‍යාපාරවල සම්පත් රේඛීය අමාත්‍යාංශය විසින් පාවිච්චි නොකළ යුතු වුවද කාර්යාංශයට අයත් වාහන 05 ක් අමාත්‍යාංශය හා බාහිර ආයතනයක් විසින් පාවිච්චි කරමින් පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුල රු.4,356,773 ක මුදලක් විදේශ සංචාර සඳහා විවිධ පුද්ගලයින්ට ලබාදී තිබුණි.

(ඇ) කාර්යාංශයේ S-IV සාමාන්‍ය සහකාර තනතුරට 2011 ජුනි 01 දින සිට කොන්ත්‍රත් පදනම මත නිලධාරින් තුන්දෙනෙකු බඳවාගෙන එදින සිට අමාත්‍යාංශයේ සේවය සඳහා යොදවා තිබුණු අතර,

සමාලෝචිත වර්ෂය අවසානය දක්වා කාර්යාංශය විසින් ගෙවන ලද පාරිශ්‍රමිකයේ වටිනාකම රු.365,000 ක් විය.

(ඈ) අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලයට පරිගණක 02 ක් හා රු. 367,874 ක් වටිනා කාර්යාල උපකරණ ලබා දී තිබුණි.

## 3.7 කාර්ය මණ්ඩල පරිපාලනය

සමාලෝචිත වර්ෂයේ කාර්ය මණ්ඩලය පිළිබඳව විස්තරයක් පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත සංඛ්‍යාව | 2011 දෙසැම්බර් 31 දිනට තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|
| මාණ්ඩලික | 237 | 162 | 75 |
| මාණ්ඩලික නොවන | 472 | 435 | 37 |
| සුළු සේවක | 178 | 149 | 29 |
| එකතුව | 887 | 746 | 141 |

ඉහත පුරප්පාඩු පිරවීමට කටයුතු නොකර කොන්ත්‍රාත් හා වැඩ බැලීමේ පදනම මත පිළිවෙලින් නිළධාරීන් 50 ක් හා 20 ක් සේවයේ යොදවා තිබුණි.

## 3.8 වාහන උපයෝජනය

පහත කරුණු නිරීක්ෂණය විය.

### (අ) කුලී වාහන ලබා ගැනීම

(i) විගණනයට ඉදිරිපත් කරන ලද කාර්යාංශය සතු වාහන ලැයිස්තුව අනුව සංචිතය සඳහා වාහන 20 කට අධික සංඛ්‍යාවක් තිබියදී 2011 ජනවාරි මාසයේ සිට නොවැම්බර් 16 දක්වා දෛනික ප්‍රවාහන කටයුතු වෙනුවෙන් පෞද්ගලික ප්‍රවාහන ආයතනයකට රු.2,580,310 ක මුදලක් ගෙවා තිබුණි. මේ අනුව සංචිතයේ ඇති වාහන භාවිතය පිළිබඳව කාර්යාංශය සැලකිල්ලක් දක්වා නොතිබුණි.

(ii) පෞද්ගලික ආයතනයකින් කුලි වාහන ලබාගැනීම තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් නිර්දේශ නොකර තිබියදි, එම පෞද්ගලික ආයතනයෙන් 2011 වසර තුල වාහන කුලියට ලබාගෙන රු. 1,424,076ක් ගෙවා තිබුණි.

**(ආ) ඉන්ධන පාරිභෝජනය**

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී / 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය පරිදි වෙන්කළ වාහන සඳහා අනුමත මාසික ඉන්ධන සීමාවන් හඳුන්වාදී තිබුණද, කාර්යාංශයේ නිලධාරීන් එම සීමා ඉක්මවා රු.1,029,593ක ඉන්ධන පරිභෝජනය කර තිබුණි.

## 4 ගිණුමකටයුතුභාවය සහ යහපාලනය.

### 4.1 අයවැය පාලනය

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2.5 ඡේදය අනුව යාවත්කාලීන කරන ලද අයවැය ලේඛනය රේඛීය අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව හා විගණකාධිපතිට ගිණුම් වර්ෂය ආරම්භ වීමට දින 15 කට පෙර ඉදිරිපත් කළයුතු වුවත් කාර්යාංශයේ සංශෝධිත අයවැය ලේඛනය 2011 දෙසැම්බර් 23 දින දාතමින් යුතුව 2011 දෙසැම්බර් 30 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. මේ අනුව අයවැය ලේඛනය තථ්‍ය මූල්‍ය ප්‍රතිඵලය හා සැසඳීම අර්ථ විරහිත විය.

## 5 පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වු පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතු වේ.

(අ) ආදායම් රැස්කිරීම.
(ආ) අත්තිකාරම් ගෙවීම.
(ඇ) ණයහිමි ශේෂ නිරවුල් කිරීම.
(ඈ) ණයගැති ශේෂ අයකර ගැනීම.
(ඉ) වාහන උපයෝජනය.
(ඊ) භෞතික සම්පත් පාලනය.